අප සමාජයේ විවිධ පුද්ගලයින් හැඳින්වීම සඳහා ඇතැම් විටක භාවිතා වන නාමකරණයන් නිෂේධනාත්මක වේ. ඒ ඔස්සේ පැමිණෙන සමාජ ගර්හාව සහ කොන් කිරීම මගින් එම පුද්ගලයින්ට පුනරුත්ථාපනයකින් පසුව හෝ සමාජය හා එක්වීමට බාධා පැමිණෙවෙයි.
කුඩ්ඩා, කුඩු ලෝලියා වැනි යෙදුම් ඊට උදාහරණ වේ. කුඩ්ඩා යන යෙදුම සමගින් ගර්හාත්මක සහ කොන් කිරීමේ ආකල්පයක් සමාජය තුළ පවතින අතර, පුවත් වාර්තාවන් ඔස්සේද නැවත නැවත කුඩ්ඩා වැනි යෙදුම් සමාජගත වීම ඔස්සේ එම ආකල්පය තවත් නරක අතට නොහැරෙන්නේදැයි අප විමසිය යුතුයි. එසේම මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් යනු හුදු "කුඩු ලෝලත්වයකට" එහා ගිය සංකීර්ණ කරුණු සමුදායක ක්‍රියාවලියක් වන හෙයින්, කුඩු ලෝලියා වැනි යෙදුමක් සමාජගත වීමද ගැටළුකාරී නොවේදැයි එසේම විමසිය යුතුවේ.
#MediaEthicsSL #lka #sinhalanews #mawbima #Aruna #Lankadeepa